## සිංහල භාෂාව හා සාහිත්‍ය තරග 2024 (කලාප)

අපේක්ෂකයාගේ නම :- ..................................................
(මුලකුරු සමග නම)

පාසලේ නම :- ..................................................

පාසල් වර්ගය :- 200 ට අඩු / 201 - 500 / 501 ට වැඩි

කොට්ඨාසය :- ..................................................

කලාපය :- ..................................................

## භාෂා භාවිතය හා අවබෝධය

කාලය පැය 03
මුළු ලකුණු 100

12 /13 ශ්‍රේණිය

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

### I කොටස

1). නම්‍ය ස්වර දෙකක් නම් කරන්න.

i. .................................................. ii. ..................................................

2). කණ්ඨතාලුජ අක්ෂර දෙකක් ලියා දක්වන්න.

i. .................................................. ii. ..................................................

3). රේඵය යෙදෙන වචන දෙකක් ලියා දක්වන්න.

i. .................................................. ii. ..................................................

4). "පියාණන් " යන පදයෙහි ඇති පිල්ලම් නම් කරන්න.

.................................................. ..................................................

5). පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියා දක්වන්න.

(අ) සරණ - ..................................................

(ආ) සරන - ..................................................

6). දී ඇති පද සඳහා සමානාර්ථ පද ලියන්න.

(අ) ඊශ්වර -.............................................. (ආ) උතුම් -..............................................

7). පහත දක්වා ඇති පද අකාරාදී පිළිවෙළට ලියන්න.

සමනලයා , අඩසඳ , පරමල් , සතුට , හැවිල්ල , අභිනික්මන , නැළවිල්ල

..................................................

..................................................

8). පහත සඳහන් නාම පද උක්ත කරන්න.

(අ) ගොවියෙකු .............................................. (ආ) තොප ..............................................

9). පහත වචන සඳහා සාමාන්‍ය ව්‍යවහාරයේ යෙදෙන පද ලියන්න.

(අ) හේමලයා .............................................. (ආ) සායම ..............................................

10). පහත සඳහන් තත්සම පද තද්භව වචන ලෙස දක්වන්න.

(අ) සමුද්‍ර .............................................. (ආ) කර්තෘ ..............................................

(ලකුණු 20)

02). පහත වාක්‍ය සදොස් නම් නිදොස් කර ලියන්න.
1. ගවයා ද කරත්තය පාරේ යයි.

..........................................................................................................................................................

2. අප පොත් කියවිය යුත්තෙමු.

..........................................................................................................................................................

3. මා විභාගයෙන් සමත් වෙති' යි ගුරුවරුන් සිතූහ.

..........................................................................................................................................................

4. නුඹලා දුක් වෙහිවා.

..........................................................................................................................................................

5. හේ ධනවතෙක් වී සිටියේ ය.

..........................................................................................................................................................

03). පහත වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න. (ලකුණු 10)
1. කම්කරුවෝ වෙහෙස නොබලා වැඩ කරති.

..........................................................................................................................................................

2. දෙවඟදයෝ විස්මිත අනාවැකි පළ කළහ.

..........................................................................................................................................................

3. ඇමතිතුමා මන්ත්‍රීවරුන් අගය කරයි.

..........................................................................................................................................................

4. බල්ලෝ සොරුන් ලුහුබඳිති.

..........................................................................................................................................................

5. ගොවියෝ රට සරු කරති.

..........................................................................................................................................................

(ලකුණු 20)

04). පහත පද කුමන සමාස වර්ගයට අයත් දැයි තිත් ඉර මත ලියන්න.

i. සිනාමල් ...................................... ii. තිනෙත් ..................................

iii. බතුයි මාළුයි ..................................... iv. කිරිබත් ........................................

v. කුකවි .......................................

(ලකුණු 05)

05). පහත සඳහන් පදවල තද්ධිත ප්‍රත්‍ය වෙන් කොට ලියන්න.

i. අපිකානු ....................................... ii. රන් මුවා .....................................

iii. කඩිති ..................................... iv. දයාවන් ...................................

v. පුරාතන ...................................

(ලකුණු 05)

06). පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**කාන්තිමත්** මිණි මුතු ඔබ්බවා විචිත්‍රාකාරයෙන් නිමවන ලද සුසැටබරණින් විභූෂිත ව සමස්ත ජම්බුද්වීපයෙහි රාව ප්‍රතිරාව දුන් **යශෝඝෝෂ** ඇති ස්වකීය මංගල අශ්ව රථයට නැඟී **විජයොත්** රථය අරා යන මාතලී මෙන් ගමන් ගත් එක් **මහේශාක්‍යයකු** වෙත දැන් මේ මනස යොමු විය යුතු ය. මේ වනාහි දමයන්තියගේ අදෘෂ්ට ප්‍රේමවන්තයා වී ඇය පිළිබඳ වූ රාජ **සන්දේශයෙන්** ප්‍රබෝධ වූ සිතැති ව භීම රාජ මාලිගය බලා යන නිෂධයේ රජ පද ප්‍රාප්ත නල කුමරු මිස සෙස්සෙක් නො වේ. යෙදිය හැකි හැම වේගයක් ම යොදා පවනට බඳු වේගයෙන් ඉදිරි බලා දිවන **සෛන්ධවයන්ගේ** පාදයනට වැඩි වේගයෙන් නල කුමරුගේ හදවතෙහි බලාපොරොත්තු දැල්වමින් ඇති බැව් ඔහු දෙස විමසිල්ලෙන් බලන්නකුට ඔහුගේ ඉරියව්වෙන් පෙනී යා යුතු ය. දමයන්ති කෙරෙහි බැඳගත් ප්‍රේමය පිළිබඳ **අභිෂේකය** ලැබීමේ අපේක්ෂාවෙන් මෙසේ නල කුමරුට ඒ අතට ම ගමන් ගත් තවත් සිවු දෙනෙක් හමු වූහ.

(I). ඡේදයෙහි තද කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදී පිළිවෙළට සකස් කර ලියන්න.

.......................................................................................................................................................

.......................................................................................................................................................

(II). වනාහි , ලැබීමේ , විභූෂිත යන වචනවල යෙදී ඇති පිල්ලම් වෙන වෙන ම ලියන්න.

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

(III). ඉහත ඡේදයෙන් උපුටා දක්වන්න.

1. ගැටය සහිත ඇලපිල්ල සහ ඌෂ්මාක්ෂරයක් යෙදී ඇති වචනයක්

   ..................................................................................................................................

2. අන්තඃස්ථාක්ෂර හතරක් සහිත වචනයක්

   ..................................................................................................................................

3. ඝෝෂ ඕෂ්ඨජ ව්‍යඤ්ජනාක්ෂරයක් සහ අනුස්වාරය සහිත වචනයක්

   ..................................................................................................................................

(iv). පහත සඳහන් පද විසන්ධි කර සන්ධි විධිය ලියන්න.

විචිත්‍රාකාරයෙන් , සුසැටබරණින් , සිතැති

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

(v). පහත දැක්වෙන ක්‍රියාවර්ගවලට උදාහරණ වචනය බැගින් ඡේදයෙන් උපුටා ලියන්න.

පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා (වර්තමාන ඒක වචන)

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

(ලකුණු 03x5 = 15)

07). පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ජනගහන ව්‍යුහයේ සිදු වෙමින් පවතින වෙනස්කම් සහ බෝවන රෝග වල සිට බෝ නොවන රෝග දක්වා රෝගයන්හි සිදු වන විකාසනය හමුවේ බෝ නොවන රෝග තත්ත්වයන් ඉහළ යෑම කෙරෙහි සෞඛ්‍ය බලධාරීන්ගේ අඛණ්ඩ අවධානය යොමු වී ඇත. හෘදවාහිනී ආශ්‍රිත රෝග , දියවැඩියාව , පිළිකා සහ නිදන්ගත පෙනහලු රෝග වැනි බෝ නොවන තත්ත්වයන් හේතුවෙන් මිය යන සංඛ්‍යාව ශ්‍රී ලංකාවේ වාර්ෂික මරණ සංඛ්‍යාවෙන් සියයට 70කට අධික බව ඇස්තමේන්තුගත කර ඇති අතර , එම රෝග තත්ත්වයන් රෝගාතුර බව හා ආබාධිත වීමට බලපාන මූලික හේතුව වේ. නිදන්ගත බෝනොවන රෝග වැළැක්වීම පිළිබඳ වූ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර ඇති අතර එමඟින් දුම්බීම, මද්‍යසාර, ස්ථූලතාව හා අසමතුලිත ආහාර හා ව්‍යායාමයෙන් තොර ජීවන රටා වැනි ප්‍රධාන බෝ නොවන රෝග හා එක්ව බැඳුණු අවදානම් සාධක අඩු කිරීම සඳහා වන ක්‍රමෝපායික මාර්ග වෙත මෙන්ම එම රෝග අවස්ථාවන් අවම කිරීම පිළිබඳව ද අවධානය යොමු කෙරෙයි. නිරාහාර රුධිර සීනි පරීක්ෂාව, ශරීර ස්කන්ධ දර්ශක මැනීම, සම්පූර්ණ කොලෙස්ටරෝල් මට්ටම හා රුධිර පීඩනය පරීක්ෂා කර ගැනීම යන සේවා ලබා දෙන සුව දිවි මධ්‍යස්ථාන දිවයින පුරා ප්‍රාථමික සෞඛ්‍ය සේවා මට්ටමින් ස්ථාපනය කර ඇත. මීට අමතරව මුඛ පිළිකා හා පියයුරු පිළිකා හා ගැබ්ගෙල පිළිකා වැනි නිවාරණය කළ හැකි පිළිකා සඳහා බලපාන මූලික හේතූන්ට පිළියම් යෙදීම අරමුණු කරගත් පිළිකා නිවාරණය හා පාලනය කිරීමේ ජාතික ප්‍රතිපත්තිය ද විධිමත් කර ඇත.

i). සෞඛ්‍ය බලධාරීන්ගේ අවධානය යොමු වී ඇති කරුණු කුමක් ද?

........................................................................................................................................................

ii). වාර්ෂික මරණ සංඛ්‍යාවෙන් විශාල ප්‍රමාණයකට හේතු වන රෝග මොනවා ද?

........................................................................................................................................................

iii). ජාතික ප්‍රතිපත්ති මඟින් අවදානම් සාධක අඩු කිරීමට ගන්නා පියවර දෙක සඳහන් කරන්න.

........................................................................................................................................................

iv). ප්‍රධාන ජීවනෝපාය හා බැඳුණු අවදානම් සාධක මොනවා ද?

........................................................................................................................................................

v). සුව දිවි මධ්‍යස්ථාන මඟින් සැලසෙන සේවාවන් සඳහන් කරන්න.

........................................................................................................................................................

vi). පිළිකා නිවාරණය හා පාලනය කිරීමේ ජාතික ප්‍රතිපත්තිය විධිමත් කිරීමේ අපේක්ෂාව කුමක් ද?

........................................................................................................................................................

(ලකුණු 12)

08). පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් වන සේ සාරාංශ කොට ලියා සාරාංශය අග වචන සංඛ්‍යාව සඳහන් කරන්න.

විවිධ විෂයයන් සම්බන්ධයෙන් පසු ගිය ශත වර්ෂ තිස්පහකට අධික කාලයක් තිස්සේ සොයා ගන්නා ලද දැනුම් සම්භාරය ගබඩාවී ඇත්තේ විවිධ භාෂාවන්ගෙන් යුක්ත ශාස්ත්‍රීය සාහිත්‍යයෙහි ය. එක් විෂයක් සම්බන්ධයෙන් ලොව සියලු ම භාෂාවලින් පළ වී ඇති පොත් එක් අයෙකුට විචාරවත් ව කියවිය හැකි නම් , ඔහු කෙබඳු ආකාරයේ ඒ විෂයට අදාළ ප්‍රාඥයකු වනු ඇද්දැයි සිතා ගත නොහැකි තරම් ය. එසේ ම එක් විෂයයක් සම්බන්ධයෙන් ලොව සියලු භාෂාවන්ට අයත් සාහිත්‍යයෙහි ගබඩා වී ඇති දැනුම ලබා ගැනීමට මිනිසකුට ජීවිත කාලය තුළ හැකි නොවන තරම් ය. එම විෂයට අදාළ ව මිනිස් වර්ගයා විසින් අලුතින් සොයාගත් දැනුම එතරම් ම පුළුල් ය. එසේ ම එම විෂයයට අදාළ දැනුමට අලුත් අදහස් නිරන්තර ව එක් වෙමින් ඒ මඟින් එම විෂයයට අදාළ දැනුම තව තවත් පෝෂණය වෙමින් පවතී. මෙම එක් විෂයයක් සම්බන්ධයෙන් පමණක් නොව ලොව සෑම විෂය ක්ෂේත්‍රයක් මෙන් ම එහි සෑම විෂයයක් සම්බන්ධයෙන් ද සිදුවන නොනවතින ක්‍රියාවලියක් ලෙස පෙනී යන කාරණයකි. මෙම අනවරත ක්‍රියාවලිය ඔස්සේ දැනුම පරම්පරාවෙන් පරම්පරාවට සාහිත්‍යය මඟින් ගෙන යන්නේ, එම ජාතීන්හි හා ශිෂ්ටාචාරයන් හි විවිධ වෙනස්කම් හා අර්බුදයන් ජනිත කරවමිනි. (ලකුණු 13)